# 03

# රෝහලේ දවසක්





සමන් අසනීපයෙන් රෝහලේ ප්‍රතිකාර ලබයි. ඔහුගේ පාසලේ මිතුරෝ ඔහු බලන්නට රෝහලට එති. සමන්ගේ අම්මා පැමිණ දොස්තර මහතා සමග කතා කරයි. සමන්ගේ දුක සැප බලන්නට එන මිතුරන් ඔහු හා කතා කරන්නේ මොනවා ද යි බලමු.

"ආ කොහොම ද උපුල්? එන්න එන්න. තිසර එන්න."

"දැන් ඔයාට කොහොම ද සමන්?"

"හොඳයි, දැන් සනීපයි."

"සමන්ගේ අම්මත් එක්කයි අපි ආවේ."

"කෝ තිසර මගේ අම්මා?"

"ඔයාගෙ අම්මා ගියා කඩේට. ඔයාට කියවන්න පත්තරයක් ගේන්න."

"ඉතිං සමන් මෙහෙම ඉන්නකොට පාළුවක් දැනෙනවා ඇතිනේද?"

"නෑ උපුල්, මෙහේ වැඩ කරන නැන්දලා මාමලා හරි හොඳයි, කරුණාවන්තයි. මාත් එක්ක කතා කරන්න සැරින් සැරේ එනවා."

"මේ වාට්ටු හරි ම පිරිසිදුයි. ලස්සනයි."

"ආ! මෙන්න නිශාන්තලත් එනවා."

"නිශාන්ත! චතුර! සුවිමල්! හරි සතුටුයි. එන්න, එන්න"

"සමන් අපි ටිකක් පරක්කු වුණා. දැන් කොහොම ද ඔයාගේ අසනීපය?"

"දැන් හොඳයි."

"ඔයා පඩිපෙළෙන් වැටෙන කොට අපි හොඳට ම බය වුණා."

"ඔව්, පන්තියේ ළමයි ඔක්කොම කෑගැසුවා."

"මටත් යන්තම් මතකයි. මගේ ඔළුව කැරකෙන්න පටන් ගත්තා. ඇස් නොපෙනී ගියා. එච්චරයි මට මතක."



"අපි ක්‍රීඩා උත්සවයට හුඟක් මහන්සි වුණා. හරියට කෑවෙත් නෑ. මතකයි නේ ද? අපි හවස පුහුණු වෙන ළමයිනුත් එක්ක බත්මුල් දෙක තුන බෙදාගෙන කෑවා."

"මට ඒ වෙලාවේ බඩගින්නක් දැනුණේ නෑ. ඒ නිසා මම බත් කෑවේ නැහැ."

"ඒක තමයි එහෙනම් ඔයාට එදා කලන්තෙ හැදුණේ."

"ආ......... අන්න සමන්ගේ අම්මා එනවා. අම්මත් එක්ක එන්නේ දොස්තර මහත්තයා නේ ද?"

"ඔව්, ඒ දොස්තර මහත්තයා හරි හොඳයි. මට හරි ම ආදරෙයි."

"පුතේ, මෙන්න පත්තරයක් ගෙනාවා. දොස්තර මහත්තයත් මා එක්ක ම ආවා."

"සමන්ට හොඳට ම සනීපයි අම්මේ, බයවෙන්න එපා. දරුවාට කලන්තයක් හැදිලා තියෙන්නේ මහන්සි වීමයි, වෙලාවට කෑම නොගැනීමයි හින්දා."

"ඇත්තමයි දොස්තර මහත්තයා, මේ දරුවෝ වෙලාවට කන්නේ නම් නෑ තමා."

"ඒක හොඳ නෑ. අනෙක් දරුවොත් හොඳට අහගන්න, මේ වැඩෙන වයසේ දී හොඳට කෑම කන්න ඕනෑ. විශේෂයෙන් උදේ කෑම වේල හරි ම වැදගත්. යෝග්‍ය පෝෂ්‍යදායක ආහාර වේලක් ගන්න ඕනෑ. වැඩෙන ළමයින්ට අවශ්‍ය ආහාර මොනවා ද කියලා ඉගෙන ගෙන ඇති නේ. නියම වෙලාවට නියම විධියට කෑම නොගත්තොත් පුතාලා දුර්වල වෙනවා. සමන්ට කලන්තෙ හැදෙන්න හේතුවත් ඒකයි."

"දොස්තර මහත්තයා, බොහොම ස්තුතියි, පුතාට අද ගෙදර යන්න පුළුවන් ද?"

"ඔව්, අද හවසට යන්න පුළුවන් වෙයි අම්මේ."

"එහෙනම් සමන්, අපි යන්නම්, හවසට ගෙදර දී හමු වෙමු."

## ක්‍රියාකාරකම 01

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.
பின்வரும் வினாக்களுக்கு விடை தருக.

i. සමන්ට රෝහල් ගත වීමට සිදුවූයේ ඇයි?
ii. සමන් වැටුණේ කොහෙන් ද?
iii. ඔහු බැලීමට රෝහලට ගිය යහළුවන්ගේ නම් මොනවා ද?
iv. දොස්තර මහතා ඔහු ගැන කීවේ කුමක් ද?
v. දොස්තර මහතා ළමයින්ට දුන් අවවාදය කුමක් ද?

## ක්‍රියාකාරකම 02

පහත දැක්වෙන යෙදුම් ඉගෙන ගන්න.
பின்வரும் தொடர்களைப் படிக்கவும்.

(අ) සංවාදයක ඇරඹුම

ආ, කොහොම ද?
හරි සතුටුයි! එන්න! එන්න!
කාලෙකට පස්සේ!
ඉතිං!
එන්න ඇතුළට! වාඩි වෙන්න.

(ආ) සංවාදයක අවසානය

අපි/මං ගිහින් එන්නං.
මුණගැහෙන්න ලැබීම සතුටක්.
ආයෙත් හම්බ වෙමු.
පසුව මුණගැහෙමු.

## ක්‍රියාකාරකම 03

දුම්රිය පොළේ දී හමු වූ රංජනී හා චතුරිකා තමන් සති අන්තයේ සහභාගි වූ අධ්‍යාපන චාරිකාව ගැන කතා කරති. සුදුසු වචන යොදා සංවාදය සම්පූර්ණ කරන්න.

புகையிரத நிலையத்தில் சந்தித்த ரஞ்சனியும் சதுரிக்காவும் வார இறுதியில் அவர்கள் கலந்து கொண்ட கல்விச் சுற்றுலா பற்றிக் கதைத்தனர். பொருத்தமான வசனங்களைப் பயன்படுத்தி கலந்துரையாடலைப் பூரணப்படுத்துக.

"කොහොම ද චතුරිකා ගමන?"

"..........................................................................................................."

"මාත් හරි කැමතියි. අපි ගමෙන් පිට ගියේ කාලෙකට පස්සෙ නෙ."

"..........................................................................................................."

"ඔව් ගිය අවුරුද්දේ අපේ පන්තියේ ළමයින් සීගිරිය බලන්න ගියා."

"..........................................................................................................."

"නෑ, හැමෝ ම සීගිරිය මුදුනට නැග්ගේ නෑ."

"..........................................................................................................."

"ඔව්, මම නං මුදුනට නැග්ගා. හරි ලස්සනයි. මුළු පළාත ම පේනවා."

"..........................................................................................................."

## ක්‍රියාකාරකම 04

සුපුන් හා අකලංක ඉතා සුහද මිතුරෝ ය. සුපුන් ගමේ පාසලට යයි. අකලංක පස්වැන්නේ ශිෂ්‍යත්වය සමත් වී නගරයේ විද්‍යාලක ඉගෙනගනියි. පාසල් නිවාඩුවේ දී මුණගැසෙන ඔවුහු තොරතුරු කතා කරති. අකලංක අලුත් පාසලේ විස්තර කියයි. සුපුන් ගමේ මිතුරන් හා කෙළිසෙල්ලම් ගැන කතා කරයි.

මේ කතාබහ ඇසුරෙන් දෙදෙනා අතර ඇති වී යැයි සිතිය හැකි සංවාදය ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම 05

"පාසල් බසය අද ධාවනය නො වීම පිළිබඳ ව සිසුන් දෙදෙනකු අතර සිදු වූ සංවාදයක්" පන්තියට ඉදිරිපත් කරන්න.

''பாடசாலை பஸ் இன்று பயணம் செய்யாதது பற்றி மாணவர்கள் இருவருக்கிடையே இடம்பெற்ற உரையாடல் ஒன்றை '' வகுப்பில் முன்வைக்குக.